ඇමුණුම 6

## නිවැරදිව වර්ධන රේඛාව හඳුනාගැනීම

**වයසට සරිලන බර දැක්වෙන සටහන - උපතේ සිට අවුරුදු 2 දක්වා (පිරිමි)**



## නියමිත වර්ධනය (N)

1. කොළපාට කලාපය (හෝ ලාකොළපාට කලාපය) තුල දී ඇති සම්මත රේඛාවන්ට සමාන්තරව දරුවාගේ වර්ධන රේඛාව ගමන් ගැනීම






## වර්ධනය අඩාලවීම (O)

1. කොළපාට කලාපය හෝ ලාකොළපාට කලාපය හෝ තැඹිලි පාට කලාපය හෝ රතු පාට කලාපය තුල දී ඇති සම්මත රේඛාවන්ට සමාන්තරව වර්ධනය වෙමින් පැවති දරුවකුගේ - **වර්ධන වේගය අඩුවීම (අපේක්ෂිත ප්‍රමාණයට බර වැඩිනොවීම)**




2. කොළපාට කලාපය හෝ ලාකොළපාට කලාපය හෝ තැඹිලි පාට කලාපය හෝ රතු පාට කලාපය තුල දී ඇති සම්මත රේඛාවන්ට සමාන්තරව වර්ධනය වෙමින් පැවති දරුවකුගේ - **බර එකම මට්ටමේ පිහිටීම (වැඩි නොවීම)**



3. කොළපාට කලාපය හෝ ලාකොළපාට කලාපය හෝ තැඹිලි පාට කලාපය හෝ රතු පාට කලාපය තුල දී ඇති සම්මත රේඛාවන්ට සමාන්තරව වර්ධනය වෙමින් පැවති දරුවකුගේ - **බර අඩුවීම**




## අඩුබර (X)

උපත් බර හා වර්ධන රේඛාව තැඹිලි කලාපයේ සිටින දරුවන් **හා** වර්ධන රේඛාව කොළපාට කලාපයේ සිට තැඹිලි පාට කලාපයට පැමිණි දරුවන්



## උග්‍ර අඩුබර (XX)

උපත් බර හා වර්ධන රේඛාව රතුපාට කලාපයේ සිටින දරුවන් **හා** වර්ධන රේඛාව තැඹිලිපාට කලාපයේ සිට රතුපාට කලාපයට පැමිණි දරුවන්



## “අධිබර” (OW)

බර රේඛාව දම්පාට කලාපයේ පැවතීම හෝ ශීඝ්‍රයෙන් සම්මත රේඛා කපාගෙන ඉහල නැගීම




අධි බර ලෙස හඳුන්වනු ලබන්නේ දිග/උසට අදාළ බර +2 SD වඩා වැඩි දරුවන්ය. කෙසේවුවත් වර්ධන සුපරීක්ෂණය සහ ප්‍රවර්ධනය කිරීමේ ජාතික වැඩ සටහනට අනුව උසට අදාළ බර තක්සේරු කිරීම සාමාන්‍යයෙන් සිදු නොකෙරෙන අතර අධිබර හඳුනා ගැනීම සඳහා වයසට අදාළ බර සැලකිල්ලට ගනු ලැබේ. වයසට අදාළ බරට අනුව අධිබරයැයි සැක කෙරෙන දරුවකු සායනයට පැමිණිවිට එම දරුවාගේ දිග/උසට අදාළ බර තක්සේරු කර සත්‍යවශයෙන්ම අධිබර දරුවකුදැයි හඳුනාගැනීමත් ඒ අනුව අවශ්‍ය මැදිහත්වීම් සිදුකිරීමත් ඉතාම වැදගත්ය.